# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1877/56 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: අඹකෝ/3/1/අ/119.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/9/2011/WS/244.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ සුළු කොට්ඨාසයේ, දික්ඔය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2014.06.30 දිනැති, අංක නු. 2878 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන 'දික්ඔය වත්ත, දරවෙල පහළ කොටස" නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0127 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංකය** 1
**ඉඩමේ නම: දික්ඔය වත්ත, දරවෙල පහළ කොටස; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0127**

*මායිම් :*

*උතුරට :* දික්ඔය වත්ත (TP 45507); *නැගෙනහිරට :* දික්ඔය වත්ත (TP 45507); සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) *දකුණට :* මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ දික්ඔය වත්ත (TP 45507); *බටහිරට :* දික්ඔය වත්ත (TP 45507);

*හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* - සීමාසහිත වටවල වැවිලි සමාගම,
අංක 60, ධර්මපාල මාවත,
කොළඹ 03.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2014 ඔක්තෝබර් මස 01 වැනි දින පෙ.ව. 11.00 ට අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2014 සැප්තැම්බර් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

එච්. එම්. සී. කේ. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2014 අගෝස්තු මස 27 වැනි දින,
අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ගිනිගත්හේන.

9 - 476


1A - G 20155 - 05 - (2014/08)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.